# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය-2015
## Primary Piriven Year End Term Test - 2015

2 වසර / Grade 2

**සිංහල**
**SINHALA**

කාලය : පැය 02 යි.
Time : Two hours.

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

පළමු වැනි ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 06කට පිළිතුරු ලියන්න.

01) පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 150කට නොඅඩු වාක්‍ය රචනයක් ලියන්න.

i. වීර මද්දුම බණ්ඩාර.
ii. මහනුවර ඇසළ පෙරහැර.
iii. ඇවිද්ද පය දහස් වටී.
iv. ඉගෙනීමේ අගය තේරුම් ගනිමු.
v. ජල සම්පත සුරකිමු.

(ලකුණු 25)

02) (අ) හ්‍රස්ව ස්වර මොනවා ද? ඒවා ලියා දක්වන්න.

(ලකුණු 05)

(ආ) පහත සඳහන් අකුරුවල ඇති පිල්ලම් නම් කරන්න.
නේ , කෲ , රා , සෘ , ගී ,පැ ,දූ , මෞ , කෲ , මේ.

(ලකුණු 05)

(ඇ) පහත සඳහන් වචනවල හිස්තැනට සුදුසු අක්ෂරය වරහන් තුළින් තෝරා ලියන්න.

i. විශි.......ය (ස් , ෂ්)
ii. ප්‍ර.......නය (දා , ධා)
iii. ශීර්ෂපා.......ය (ට , ඨ)
iv. වි......මය (ශ් , ස්)
v. ම.......ඩපය (න් , ණ්)

(ලකුණු 05)

03) (අ) පහත සඳහන් වචන අකාරාදි පිළිවෙළට ලියන්න.
හිස , අත් , පාද , කණ් , දිව , බඩ , නාසය , වැලමිට , මුහුණ , තොල්.

(ලකුණු 05)

(ආ) පහත දැක්වෙන වචනවල ඉරි ඇඳි අකුරුවල ස්වර ව්‍යඤ්ජන වෙන් කරන්න.

i) ගාල්ල.
ii) බෝධිය.
iii) සාගරය.
iv) සොහොන් බිම.
v) මෝහාන්ධකාරය.

(ලකුණු 05)

(ඇ) පහත සඳහන් පදවලට සමානාර්ථ පද දෙක බැගින් ලියන්න.

i) අම්මා.
ii) කැලය.
iii) සේවකයා.
iv) මිත්‍රයා.
v) නිවස.

(ලකුණු 05)

04) (අ) ජාති , ද්‍රව්‍ය , ගුණ , ක්‍රියා , සංඥා නාම පද දෙක බැගින් ලියන්න.

(ලකුණු 05)

(ආ) "පුත්" ශබ්දය සියලු විභක්තිවල වරනගන්න.

(ලකුණු 10)

05) (අ) නිපාත සහ උපසර්ග යන පද වර්ග දෙක කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ආ) පහත සඳහන් වාක්‍යවල හිස්තැනට වඩාත් සුදුසු සර්වනාම පදය ලියා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. .................. මතට ගිජු වෙයි.

ii. .................... ගී ගයද්දී ඔවුහු සතුටින් සිටියහ.

iii. .................... උදෙන්ම පාසැල වෙත පැමිණියෙමි.

iv. පන්තියේ සිසුන් අතරින් ................. දක්ෂ සිසුවෙකි.

v. මිහිරි ගීයක් ගායනා කළ .................. පියකරු ළදැරියකි.

(ලකුණු 10)

06) "රෝහිණී" නවකතාවේ ඔබ සිත්ගත් චරිත දෙකක් (02) නම් කර, එසේ සිත් ගැනීමට හේතු දක්වන්න.

(ලකුණු 15)

07) යහපත් ජීවිතයකට උපදෙස් සපයන කෘතියක් ලෙස "සුභාෂිතය" අගය කරන්න.

(ලකුණු 15)

08) රසවත් බව සහ අර්ථවත් බව කථාමෘතයේ සියලු කතාවල ඇතුළත්ව තිබේ.
ඔබ කැමති කතාවක් ඇසුරින් මේ අදහස තහවුරු කරන්න.

(ලකුණු 15)